# පොලීසිය



GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# හැඳින්වීම

**මේ මාර්ගෝපදේශ අදාළ වන්නේ,**

a) ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ ලිංගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් වින්දිතභාවයට පත් වූවන්/ ශේෂිතයින් (දිවි ගලවාගත් තැනැත්තන් ) - Victim-Survivors,

b) පැමිණිලි සටහන් කරගනු ලබන පොලිසිය,

c) වෛද්‍ය පරීක්ෂණ මෙහෙයවන අධිකරණ වෛද්‍ය නිලධාරීන්,

d) ශේෂිතයාට/ වින්දිතභාවයට පත් පුද්ගලයාට සහාය ලබාදෙන හිතෛෂිවන්තයා/ මානව හිමිකම් නීතිඥයා හෝ සංවිධානයටයි.

ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ඉහල අගයක් ගනී. 2020දී පමණක් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට අඩු ගැහැනු ළමුන් දූෂණය කිරීම්) සිද්ධි 1391ක් සහ ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට වඩා වැඩි කාන්තාවන් දූෂණය කිරීම්) 257ක් පොලිසියට වාර්තා වී ඇත.

(https://www.police.lk/wp-content/uploads/2023/07/GRAVE-CRIME-ABSTRACT-FOR-WHOLE-ISLAND-FROM-01.01.2022-TO-31.12.2022.pdf බලන්න.)

2024 ජනවාරි 04 සිට මාර්තු 10 දක්වා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශයේ ස්ථාපිත විශේෂ ඒකකයට '109' ක්ෂණික ඇමතුම් අංකය හරහා කාන්තාවන් සහ ළමයින්ට එරෙහි අපයෝජන, ප්‍රචණ්ඩත්වය සහ විවිධ හිරිහැර කිරීම් සම්බන්ධ පැමිණිලි 1,077ක් ලැබී ඇත.


( https://www.adaderana.lk/news.php?nid=98185 )

ශ්‍රී ලංකාව තුළ සිදු කළ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණවලින් පෙනී යන්නේ ලිංගික හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වයට අදාළ සත්‍ය සිදුවීම් පොලිසියට වාර්තා වූ ප්‍රමාණයට වඩා වැඩි බවයි. මෙසේ පැමිණිලි නොකිරීමට බොහෝ හේතු ඇත.

එම හේතුන් ලෙස ලිංගික හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වය පිළිබඳ කළ පර්යේෂණවල දී සහ ශේෂිතයින්/ දිවි ගලවාගත් තැනැත්තන් සමඟ සාකච්ඡා කිරීමෙන් ඔවුන් අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියා පටිපාටිවල හිඩැස් සහ ඒ පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැතිකම ඉස්මතුව පෙනුණි.

පොලිස් ස්ථානයට පැමිණෙන ශෝෂිතයින් තමන් විසින් ගත යුතු පියවර සහ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ නොදැනුවත් හෝ අවිනිශ්චිත බවකින් පසුවිය හැකිය. ඔවුන්ට සහාය වීමේදී කම්පන සහගත අත්දැකීමක් වාර්තා කිරීම සහ අපරාධකරුවන් නීතිය හමුවට ගෙන ඒම සම්බන්ධයෙන් ශෝෂිතයින්ට පහසුවක් ඇති කිරීමට පොලිස් නිලධාරීන් විසින් ඉතා වැදගත් ශ්‍රී ලංකාවේ පවතින නීතියට අනුව පැමිණිලි බාර ගැනීමේ කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

මෙහිදී පොලිසිය අනුගමනය කළ යුතු අනිවාර්ය ක්‍රියා පටිපාටි සහ SGBV පැමිණිලි වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි තිබේ. මෙම මාර්ගෝපදේශ මඟින් එම ක්‍රියා පටිපාටි සහ පොලිසියේ වගකීම් පිළිබඳ ඔබට වැදගත්වන යෝජනා පියවරෙන් පියවර ඉදිරිපත් කරයි.



# සිදුවීම් සහ ක්‍රියාපටිපාටිය

SGBV සිදුවීමකදී ශේෂිතයින්ගේ කැමැත්ත සහිතව වෙනත් ඕනෑම පුද්ගලයකුට පොලිසියට පැමිණිල්ලක් කළ හැකිය. එලෙස පැමිණිල්ලක් කළ හැකි පිරිස වන්නේ

- ශේෂිතයා /දිවිගලවාගත් තැනැත්තා (survivor) / වින්දිතභාවයට පත් වූ පුද්ගලයා (Victim)
- ග්‍රාම සේවා නිලධාරි (GN/GSO)
- කාන්තා සංවර්ධන නිලධාරි(WDO)
- කාන්තා සංවර්ධන සමිති ( Women’s Development Society)
- පරිවාස නිලධාරි (Probation Officer)
- සමාජ සේවා නිලධාරි ( Social Services Officer)
- පවුලේ සාමාජිකයන් ( Family Members)
- මිත්‍ර ප්‍රජාවක්/ආගමික නායකයෙක් ( A Community member/Religious Leader )
- අසල්වැසියන්( Neighbors)
- සිද්ධි කළමනාකරු (සිද්ධි කළමනාකරුවකු යනු උපදේශනය ඇතුළත් සේවා පරාසයකින් කළමනාකරණය කිරීමට පත් කරන ලද පුද්ගලයෙකි.)
- වෛද්‍යවරයකු ( A Doctor)
- විදුහල්පතිවරුන් හෝ ගුරුවරුන්



# පොලිස් පැමිණිලි පටිපාටිය

- නීතියට අනුව පොලිසියේදී ශේෂිතයාට තම භාෂාවෙන් පැමිණිල්ල ලිඛිතව සටහන් කිරීමට අවශ්‍ය වේ. **(109 (2) වගන්තිය, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත)**

- <u>**පැමිණිල්ල ඉදිරිපත් කිරීමේදී පැමිණිල්ල සටහන් කිරීමට ශේෂිතයාට තමාගේ භාෂාව කතා කරන පොලිස් නිලධාරියකු ඉල්ලා සිටිය හැකිය.**</u> ඒ වෙනුවෙන් සෑම සාධාරණ උත්සාහයක්ම ගන්නා ලෙස පොලිසියට උපදෙස් ලැබී ඇත. **ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 (1) සහ (2) ව්‍යවස්ථාවට අනුව සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂාව ලෙස පිළිගනී; ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි ව්‍යවස්ථාවට අනුව සිංහල සහ දෙමළ ජාතික භාෂා ලෙස පිළිගනී.**

**අපරාධ නඩු විධාන පනතේ 109 (2) වගන්තිය යටතේ පැමිණිල්ල ලබා දී ඇති භාෂාවෙන් ගත යුතුය. නමුත්**

**එය කළ නොහැකි නම්**

a. ලිඛිතව තොරතුරු ලබා දෙන ලෙස පොලිස් නිලධාරියා ශේෂිතයාගෙන් ඉල්ලා සිටිය යුතුය.

**එයත් කළ නොහැකි නම්**

b. පැමිණිල්ල ජාතික භාෂාවකින් වාර්තාකර, පැමිණිල්ල ශේෂිතයාට කියවීම හෝ ඇයට/ඔහුට වැටහෙන භාෂාවකින් එය පැහැදිලි කිරීම/ අර්ථකතනය කිරීම/පරිවර්තනය කිරීම කළ යුතුය. එම පොලිස් ස්ථානයේ කිසිම පොලිස් නිලධාරියකු ඒ භාෂාව නොදන්නේ නම්, ස්ථානාධිපතිවරයාගේ අභිමතය පරිදි අවශ්‍ය භාෂාව කතා කරන ළඟම ඇති පොලිස් ස්ථානයක නිලධාරියකු ගෙන්වාගෙන පැමිණිල්ල පැහැදිලි කිරීම/ අර්ථකතනය කිරීම/ පරිවර්තනය කිරීම කළ හැකිය.




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

- ශේෂිතයාට කැමති භාෂාවෙන් පැමිණිල්ල සටහන් කිරීමට පහසුකම් සැලසීමට පොලිසිය විසින් සෑම සාධාරණ උත්සාහයක්ම ගත යුතුය. **ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවෙහි (2) ව්‍යවස්ථාව භාෂාව පදනම් කරගෙන වෙනස්කොට සැලකීම්වලට ලක් නොවීමට ඇති මූලික අයිතිය පිළිගනී.**



- පැමිණිල්ල සටහන් කිරීමෙන් අනතුරුව පැමිණිල්ල නිවැරැදිව සටහන් කර ඇති බව තහවුරු කිරීමටත්, ශේෂිතයාට කිසියම් වෙනස් කිරීමක්/නිවැරදි කිරීමක් සිදු කිරීමට අවශ්‍ය නම් එම වෙනස්කම/නිවැරදි කිරීම ඔහු/ඇය ලවාම සිදු කළ යුතුය.

- සියල්ල නිවැරදි බවට තහවුරු කරගත් පසු පැමිණිල්ලට අත්සන තබන ලෙස **ශේෂිතයාට දැනුම් දිය යුතු අතර පැමිණිල්ල පිළිගත් බවට රිසිට්පතක් නිකුත් කළ යුතුව ඇත . (109 (3) වගන්තිය සහ 110 වගන්තිය, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත)**

අදාළ වරද ලිංගිකමය ස්වභාවයේ වරදක් වන අවස්ථාවක දී, වරද පිළිබඳ විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කළ යුතු නිලධාරියාගේ ස්ත්‍රී පුරුෂභාවය නිශ්චිතව සඳහන් කිරීමට ඔබට අයිතියක් ඇත. ඊට අනුකූල වීමට සියලු උත්සාහයන් දැරීමට රජයට යුතුකමක් ඇත. (2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 3(1)(උ) වගන්තිය සහ 3(2) වගන්තිය).

- පැමිණිල්ල පිළිබඳ පළමු තොරතුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත වාර්තා කළ යුතුය. (එසේත් නැත්නම් පොලිස් ස්ථානය දිනපතා දිස්ත්‍රික් පොලිස් මූලස්ථානයට වාර්තා කරන්නේ නම්, දිස්ත්‍රික් පොලිස් මූලස්ථානයේ ප්‍රධානියාට (HQI), සහ/හෝ පොලිස් මූලස්ථාන පරීක්ෂකගේ (HQI) රෙජිස්ටරයේ සටහන් කළ යුතුය.) **(අපරාධ අධිකරණ ක්‍රියා පටිපාටිය 109 (4) වගන්තිය බලන්න.)**

- මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් පැමිණිල්ල/තොරතුරු ඇගයීමට ලක් කර අදාළ පොලිස් ස්ථානයේ අදාළ ශාඛාවට නියෝග ලබා දෙනු ඇත. (උදා: අපරාධ අංශයට හෝ වැඩිදුර විමර්ශන සඳහා කාන්තා හා ළමා අංශයට)

- පසුව අදාළ ස්ථානයේ අදාළ ශාඛාවේ පොලිස් කණ්ඩායම විසින් විමර්ශන අරඹා; **එම ස්ථානය/දර්ශනය නැරඹීම සිදු කළ යුතුය; ඔවුන්ගේ නිරීක්ෂණ වාර්තා කරන්න; සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කරගන්න; ශෝෂිත පුද්ගලයාගේ පැමිණිල්ල සටහන් කරගන්න** (පැමිණිල්ල වෙනත් පුද්ගලයකු/නිලධාරියකු/ආයතනයක් හරහා ලැබී ඇත්නම්

- ශෝෂිතයකු අපරාධය සිදු වූ ස්ථානයට ගෙන ගොස් සාක්ෂි එකතු කිරීමට පොලිසියට බලය ඇත.



GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# වෛද්‍ය පරීක්ෂණය




- පොලිසිය විසින් **ශෝෂිත පුද්ගලයා සහ අපරාධය කළ බවට සැක කරන පුද්ගලයා යන දෙදෙනාම වෙන වෙනම රෝහලට රැගෙන ගොස් සාක්ෂි එකතු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට ඇතුළත් කළ යුතුය.**
- MLEF යනු JMO විසින් ශෝෂිත පුද්ගලයකුගේ අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීම සඳහා පොලිසිය විසින් භාවිත කරන පෝරමයයි. MLEF යනු සාමාන්‍යයෙන් පිටු දෙකක ලේඛනක් වන අතර, එමඟින් අපරාධයේ ස්වභාවය/ බරපතලකම තහවුරු කරයි.
- පොලිසිය විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ (MLEF) කොටු අංක 1 සිට 8 දක්වා පුරවා වෛද්‍ය පරීක්ෂණයට පෙර JMO වෙත භාර දිය යුතුය. JMO විසින් කොටු අංක 9 සිට 22 තෙක් පිරවිය යුතුය.
- JMO විසින් සම්පූර්ණ කරන ලද පෝරමය පරීක්ෂණය අවසන් වූ වහාම පොලිසියට භාර දිය යුතුය




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

- ශේෂිතයා යම් ලිංගික හිංසනයකට ගොදුරු වී ඇත්නම් (ලිංගික හිංසනය පිළිබඳ නිර්වචනය සඳහා
- [http://www.commonlii.org/lk/legis/num_act/pca22o1995213/),](http://www.commonlii.org/lk/legis/num_act/pca22o1995213/)

  බලන්න). සහ/හෝ ඝාතනය කර ඇත්නම් හෝ පොලිසියට වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකි අපරාධයක් කර ඇත්නම් (අපරාධ නඩු විධාන පනත උපලේඛන 1 බලන්න) එවිට පළමු තොරතුර (F1) ලැබුණු වහාම මහේස්ත්‍රාත්වරයාට දැනුම්දීමට පොලිසිය බැඳී සිටියි.

- තොරතුරු මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙත ද යවනු ලැබේ. ශේෂිතයා (ජීවත්ව සිටින්නේ නම්) අධිකරණ වෛද්‍ය නිලධාරියා (JMO) වෙත වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කරනු ඇත. ශේෂිතයා මියගොස් ඇත්නම්, මහේස්ත්‍රාත්වරයා පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා දේහය යොමු කරනු ඇත.






- ලිංගික ප්‍රචණ්ඩත්වයේ ශේෂිත පුද්ගලයකු නම් JMO වෙත ඉදිරිපත් කිරීමට පෙර මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.
- වලංගු කැමැත්ත ලබා දීමට මවුපියන් හෝ භාරකරුවන් නොමැති, ළමා වින්දිතයින් මීට අදාළ නොවේ. එවැනි අවස්ථාවලදී මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයක් ලබා ගත යුතුය.




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# නීතිමය ක්‍රියාවලිය

- පොලිසිය JMO වෙතින් MLEF පෝරමය ලබාගෙන අවශ්‍ය සියලුම ලියකියවිලි සකස් කර අදාළ පොලිස් ස්ථානයේ අධිකරණ ශාඛාව වෙත භාර දෙනු ඇත.
- අධිකරණ ශාඛාව විසින් MLEF (බී වාර්තාව සහ අනෙකුත් සාක්ෂි එකතු කර) මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
- පොලිස් ස්ථානයේ අධිකරණ ශාඛාව විසින් අපරාධ සම්බන්ධ සියලුම ලිපි ලේඛන හසුරුවනු ලබයි. අධිකරණයට යනු ලබන්නේ උසාවි කටයුතු සඳහා සහභාගිවන පොලිස් නිලධාරීන්මය.
- ඔවුන් විසින් (පළමු) 'බී වාර්තාව' සහ පසුව 'වැඩිදුර වාර්තා' ගොනු කරන්නේ විමර්ශනවල වර්ධනය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ දැනගැනීම පිණිසය. එමෙන්ම ඔවුන් උසාවියට ගොස් අදාළ නියෝග/මඟපෙන්වීම් ඉල්ලා සිටියි.
- ශේෂිතයා / වින්දිතයා  අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත රැගෙන යන තෙක් අපි පොලිස් මාර්ගෝපදේශ සම්පූර්ණ කර ඇත. ඉන් පසු, පොලිසියට අධිකරණයට යුතුකමක් ඇත - පොලිසිය අවශ්‍ය පරිදි අධිකරණයට සහාය විය යුතුය.




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# කණ්ඩායම

- **මහාචාර්ය නෙලූෆර් ද මෙල්**
  *(සම අධ්‍යක්ෂ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ ආරක්ෂක මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය)*
- **ආචාර්ය ජීන් පෙරේරා**
  *(* **ජ්‍යෙෂ්ඨ** *උපදේශක, ව්‍යාධිවේදය සහ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය.*
  *අධිකරණ වෛද්‍ය හා විෂ විද්‍යා අංශයේ විශ්‍රාමික (සභාපති) මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව)*
- **රනිතා ඥානරාජා**
  *(නීතිඥ)*
- **සඳනි යාපා අබේවර්ධන**
  *(නීතිඥ)*
- **හැරී ප්‍රනාන්දු**
  *(කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය)*
- **රුවංගි අමරසිංහ**
  *(ෆෝල්ඩ් මාධ්‍ය සාමූහිකය)*